# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## අධිකරණ සංවිධාන (සංශෝධන)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය විසින්
2017 සැප්තැම්බර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 අගෝස්තු මස 21 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

**[205 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## *නීතිය බලපෑමේ ප්‍රකාශය*

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම වේ.

## අධිකරණ සංවිධාන
## (සංශෝධන)

එල්. ඩී. — ඕ. 32/2017.

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක -- දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 2 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තියේ (අ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> “(අ) "මහාධිකරණ විනිශ්චයකාරවරයා” යනුවෙන් එක් එක් විනිශ්චයකාරවරයා හඳුන්වනු ලැබිය යුතු දස දෙනකුට අඩු නොවන්නා වූ ද අසූ පස්දෙනකුට වැඩි නොවන්නා වූ ද විනිශ්චයකාරවරයන්ගෙන්;”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.